# ආරක්ෂක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## මිල ගණන් කැඳවීමයි

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත නැවුම් හා වියළි ආහාර ද්‍රව්‍ය සැපයීම සහ බෙදාහැරීම සඳහා ප්‍රසම්පාදනය - 2024

### කොන්ත්‍රාත් හඳුනා ගැනීමේ අංකය :- *S&T/03/DRY RATION/FRESH RATION/2024(14)*

1. 2024 වසර සඳහා ත්‍රිවිධ හමුදාව වෙත නැවුම් සහ වියළි ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනය වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) සභාපති විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන් සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ සීමිත සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් ආයතනයක් ලෙස ස්ථාපිත නිෂ්පාදන, තොග හා සිල්ලර මෙහෙයුම්කරුවන්ගෙන් පහත සඳහන් ආහාර කාණ්ඩ යටතේ දක්වා ඇති මූලස්ථාන / කඳවුරු වෙත සැපයීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. සැපයුම් වර්ෂය **2024 ජනවාරි 01** වන දින සිට **2024 දෙසැම්බර් 31** වන දින දක්වා වර්ෂයක කාලයක් සඳහා වේ.

**1.1 මූලික කඳවුරු කාණ්ඩයන් හා අනුරූපී කාණ්ඩයන්**

**1.1.1 A කාණ්ඩය - සියලුම නැවුම් ආහාර කඳවුරු**

| මූලස්ථාන / කඳවුරු | | | ආහාර කාණ්ඩයන් |
|---|---|---|---|
| 1.1.1.1 අයියකච්චි | 1.1.1.33 කටුබැද්ද | 1.1.1.65 පූනරීන් | **සියලුම නැවුම් ආහාර අයිතමයන්** (එළවළු, පලතුරු, මාළු, මස් වර්ග/ ශීතකළ ආහාර, ලෙලි රහිත පොල්, කිකිළි බිත්තර, කිරි නිෂ්පාදන |
| 1.1.1.2 අම්පාර | 1.1.1.34 කටුනායක | 1.1.1.66 පාන්ගොල්ල | |
| 1.1.1.3 අඟුණවැල් පැලැස්ස | 1.1.1.35 කරන්දෙණිය | 1.1.1.67 පූනානි | |
| 1.1.1.4 අක්කරායන්කුලම් | 1.1.1.36 කෑගල්ල | 1.1.1.68 පුත්තලම | |
| 1.1.1.5 අක්කරෙයිපත්තු | 1.1.1.37 කොහොඹගස්හන්දිය | 1.1.1.69 පුදුකුඩුඉරිප්පු | |
| 1.1.1.6 අකුරේගොඩ (බත්තරමුල්ල) | 1.1.1.38 කොක්චිළිය | 1.1.1.70 රන්ටැඹේ | |
| 1.1.1.7 අල්ලකන්තලේ | 1.1.1.39 කොස්ගම | 1.1.1.71 සේනපුර | |
| 1.1.1.8 අඹේපුස්ස | 1.1.1.40 කොත්මලේ | 1.1.1.72 සිංහපුර (පදවි ශ්‍රීපුර) | |
| 1.1.1.9 බදුල්ල | 1.1.1.41 කුරුණෑගල | 1.1.1.73 සිංහපුර (වැලිකන්ද) | |
| 1.1.1.10 බලල්ල | 1.1.1.42 කෝමාරිය | 1.1.1.74 තන්තිරිමලේ | |
| 1.1.1.11 බටලන්ද | 1.1.1.43 කුරුවිට | 1.1.1.75 තාරාවිකුලම් | |
| 1.1.1.12 දේවහුව | 1.1.1.44 කිරංචි | 1.1.1.76 තිරියාය | |
| 1.1.1.13 බූස්ස | 1.1.1.45 කුකුළේගඟ | 1.1.1.77 ත්‍රිකුණාමලය | |
| 1.1.1.14 බුත්තල | 1.1.1.46 ලක්ෂපාන | 1.1.1.78 තුනුක්කායි | |
| 1.1.1.15 දෙහිඅත්තකණ්ඩිය | 1.1.1.47 මාදම්පේ | 1.1.1.79 උඩවලවේ | |
| 1.1.1.16 දිගන (මාබේරියතැන්න) | 1.1.1.48 මාදුරුඔය | 1.1.1.80 උකුවෙල | |
| 1.1.1.17 දොඹගොඩ | 1.1.1.49 මාන්කුලම් | 1.1.1.81 උන්නච්චිය | |
| 1.1.1.18 දඹුල්ල (ඉනාමළුව) | 1.1.1.50 මත්තේගොඩ | 1.1.1.82 ඌව - කුඩා ඔය | |
| 1.1.1.19 ඇඹිලිපිටිය | 1.1.1.51 මාන්තෝට්ටම් | 1.1.1.83 වවුනියාව | |
| 1.1.1.20 ගජසිංහපුර | 1.1.1.52 මන්නාරම | 1.1.1.84 විශ්වමඩු | |
| 1.1.1.21 ගණේමුල්ල | 1.1.1.53 මාතර | 1.1.1.85 වාකරෙ | |
| 1.1.1.22 හොරොව්පතාන | 1.1.1.54 මයුරපුර (නාගර්වැව) | 1.1.1.86 වාලච්චේන | |
| 1.1.1.23 ඉපලෝගම | 1.1.1.55 මන්කිබ්‍රිජ් | 1.1.1.87 වරනි | |
| 1.1.1.24 යාපනය | 1.1.1.56 මොරවැව | 1.1.1.88 වෙල්ලන්කුලම් | |
| 1.1.1.25 කලාඔය | 1.1.1.57 නැදුන්කර්නි | 1.1.1.89 වෙල්ලන්කුලම් (වවුනියාව) | |
| 1.1.1.26 කල්ලඩි | 1.1.1.58 නාඋල | 1.1.1.90 වේයන්ගොඩ | |
| 1.1.1.27 කල්ලාර් | 1.1.1.59 නුවරඑළිය | 1.1.1.91 වෙඩිතලතිවු | |
| 1.1.1.28 කඹුරුපිටිය | 1.1.1.60 ඔඩ්ඩුසුඩාන් | 1.1.1.92 වීරවිල | |
| 1.1.1.29 කල්ලිඅඩි | 1.1.1.61 පදවිපරාක්‍රමපුර | 1.1.1.93 වැලිකන්ද | |
| 1.1.1.30 කනගරායන්කුලම් | 1.1.1.62 පැලවත්ත | 1.1.1.94 වෙත්තලකර්නි | |
| 1.1.1.31 මහනුවර | 1.1.1.63 පේසාලෙ | 1.1.1.95 යාල පලටුපාන | |
| 1.1.1.32 කතරගම | 1.1.1.64 පේදුරු තුඩුව | | |

**1.1.2 B කාණ්ඩය - වර්ගීකරණය කළ නැවුම් ආහාර කඳවුරු**

| මූලස්ථාන / කඳවුරු | නැවුම් ආහාර ද්‍රව්‍ය කාණ්ඩය |
|---|---|
| 1.1.2.1 පනාගොඩ | (i) එළවළු |
| 1.1.2.2 අනුරාධපුරය | (ii) පළතුරු |
| 1.1.2.3 හිඟුරක්ගොඩ | (iii) මාළු වර්ග |
| 1.1.2.4 කන්කසන්තුරේ | (iv) මස් වර්ග / ශීත කළ ආහාර |
| 1.1.2.5 මුලතිව් | (v) ලෙලි රහිත පොල් |
| 1.1.2.6 කිලිනොච්චි | (vi) කිකිළි බිත්තර |
| 1.1.2.7 දියතලාව | (vii) කිරි නිෂ්පාදන |
| 1.1.2.8 රත්මලාන | (viii) Co 3 තණ කොළ (දියතලාව සහ රත්මලාන කඳවුරු සඳහා පමණි) |

**1.1.2 C කාණ්ඩය - වියළි ආහාර ද්‍රව්‍යයන්**

| ප්‍රධාන කඳවුරු | වියළි ආහාර ද්‍රව්‍යයන් |
|---|---|
| 1.1.3.1 පනාගොඩ | වියළි ආහාර ද්‍රව්‍ය (අයිතම 168) |
| 1.1.3.2 අනුරාධපුරය | |
| 1.1.3.3 හිඟුරක්ගොඩ | |
| 1.1.3.4 කන්කසන්තුරේ | |
| 1.1.3.5 මුලතිව් | |
| 1.1.3.6 කිලිනොච්චි | |
| 1.1.3.7 දියතලාව | |
| 1.1.3.8 රත්මලාන | |

**1.2** සියලු ආහාර ද්‍රව්‍යයන්හි පිරිවිතර, ලංසු අයදුම්පත් සමග නිකුත් කරනු ලැබේ. සපයනු ලබන සියලුම ආහාර ද්‍රව්‍ය මිනිස් පරිභෝජනය සඳහා සුදුසු තත්ත්වයේ තිබිය යුතු අතර, ඒ සඳහා වන ප්‍රමිති නිර්ණායකයන් ලංසු ලේඛනයේ අදාළ ඇමුණුම් තුළ නිශ්චිතව දක්වා ඇත. ඒ අනුව සියලුම සැපයීම්, 1980 අංක 26 දරන ආහාර පනත හා ඊට සිදු කරන ලද සංශෝධන සහ වරින්වර බලාත්මක කරන ලද රෙගුලාසිවලට අනුකූල විය යුතුය.

**1.3 එක් එක් මූලස්ථාන/ කඳවුරු සහ ආහාර ද්‍රව්‍ය කාණ්ඩ යටතේ ලංසු ඉදිරිපත් කිරීම.**

1.3.1 ඉදිරිපත් කරන සියලුම ලංසු අදාළ මූලස්ථාන/ කඳවුරු/ ආහාර කාණ්ඩ සඳහා වෙන වෙනම ඉදිරිපත් කළ යුතු අතර එයට අදාළ සියලුම ආහාර ද්‍රව්‍ය සඳහා වෙන වෙනම මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වන ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ.

1.3.2 මිලදී ගන්නා විසින් ඇගයීමට ලක් කෙරෙනු ලබන ලංසුකරුවාගේ හැකියාව අනුව ඕනෑම ලංසුකරුවෙකුට එක් කඳවුරකට හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයකට අදාළ ලංසු ඉදිරිපත් කළ හැකි අතර, අදාළ ආහාර කාණ්ඩවලට වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය. පහත සඳහන් කාණ්ඩ සඳහා එය වලංගු වේ.

**1.3.2.1 A කාණ්ඩය - සියලුම නැවුම් ආහාර කාණ්ඩය සැපයීම (තනි කඳවුරු පදනම)**

මෙම කාණ්ඩය ලංසු 95 කින් සමන්විත වන අතර වෙනම ප්‍රසම්පාදන ලෙස සලකනු ලැබේ. ඇගයීම් සහ තේරීම් ක්‍රියාවලිය වෙන වෙනම ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.3.2.2 B කාණ්ඩය - වර්ගීකරණය කළ නැවුම් ආහාර කාණ්ඩය සැපයීම**

මෙම කාණ්ඩය ලංසු 58 කින් සමන්විත වන අතර (කඳවුරු 08 × කාණ්ඩ 07 = ලංසු 56 + ලංසු 02) වෙනම ප්‍රසම්පාදනයක් ලෙස සලකනු ලැබේ. ඇගයීමේ හා තේරීමේ ක්‍රියාවලිය වෙන වෙනම සිදු කරනු ලැබේ.

**1.3.2.3 C කාණ්ඩය - වියළි ආහාර ද්‍රව්‍ය සැපයීම (තනි කඳවුරු පදනම)**

මෙම කාණ්ඩය ලංසු 1344 කින් සමන්විත වන (කඳවුරු 08 × අයිතම 168 = ලංසු 1344) අතර වෙනම ප්‍රසම්පාදන ලෙස සලකනු ලැබේ. ඇගයීම් සහ තේරීම් ක්‍රියාවලිය වෙන වෙනම ක්‍රියාත්මක කරනු ලැබේ.

2. තෝරා ගන්නා ලද සැපයුම්කරුවන් අදාළ මූලස්ථාන/ කඳවුරු හා අනු කාණ්ඩ වෙත ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය කර ගෙනැවිත් දීම සම්බන්ධව කොන්ත්‍රාත්තුවේ කොටසක් ලෙස වගකිව යුතුය. එක් එක් මූලස්ථාන/ කඳවුරු සහ අනු කාණ්ඩ පිළිබඳව විස්තර ලංසු ලේඛණයෙහි ඇතුළත් කර ඇත.

3. සැපයුම්කරුවන් තෝරා පත්කර ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි ඡේද 3.2 ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ සිදු කරනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ හැක්කේ දේශීය ලංසුකරුවන්ට පමණි.

4. ලංසුකරු අසාධුලේඛණ ගත ලංසුකරුවෙකු නොවිය යුතුය.

5. අදාළ සුදුසුකම් සනාථ කිරීම කළ හැකි ලේඛනයන් ද ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. පශ්චාත් සුදුසුකම් පරීක්ෂාවේ දී එම සුදුසුකම් ලංසු ලේඛනවල දක්වා ඇති විස්තරාත්මක ක්‍රමවේදය යටතේ ප්‍රමාණාත්මක ඇගයීමකට භාජනය කර එක් එක් අවම ලංසු ඉදිරිපත් කර ඇගයීමට ලක් වූ ලංසුකරුවන් වෙත පිරිනමන උපරිම කොන්ත්‍රාත්තු ප්‍රමාණය තීරණය කරනු ලැබේ. මූලික ලංසු ඇගයීම සඳහා පහත දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5.1 ආසන්නතම මූල්‍ය වර්ෂ 3 ඇතුළත ඕනෑම මූල්‍ය වසර 2 ක් සඳහා අදාළ ආහාර සැපයුම් ක්ෂේත්‍රයේ අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම **රුපියල් මිලියන 10** ක් විය යුතු අතර, අදාළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මගින් තහවුරු කළ යුතුය.

5.2 අවම වශයෙන් **රුපියල් මිලියන 05** ක ද්‍රවශීල වත්කම් (අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, කෙටිකාලීන ආයෝජන සහ ලැබිය යුතු කෙටි කාලීන ණය) වත්කමක් ඇති බව (2022/ 2023 මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව) ඊට අදාළ මූල්‍ය ප්‍රකාශන මගින් තහවුරු කළ යුතුය. කෙසේ වෙතත් ලංසුකරුවා 2022/ 2023 වසර සඳහා ලංසු සමග විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ නම්, **පශ්චාත් සුදුසුකම් සනාථ කිරීමේ අදියරේ** දී **2023.08.30** ට පෙර විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

5.3 ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් අනුමත දැනට ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් හෝ මූල්‍ය ආයතන විසින් (මෙම ටෙන්ඩරය සඳහා ම) සපයනු ලබන අවම ණය සීමාව **රුපියල් මිලියන 05** විය යුතුයි.

5.4 **නැවුම් ආහාර අයිතමයන්** සැපයීම සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම්, ශීත කාමර/ අධි ශීතකරණ සහ ශීත ට්‍රක් රථ පහසුකම් සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සඳහන් කළ යුතුය. (එම පහසුකම් හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට/ කුලියට ලබාගෙන තිබිය හැක.) ඒ සම්බන්ධ අමතර තොරතුරු ලංසු ලේඛනය සමග සපයනු ලැබේ.

5.5 **වියළි ආහාර අයිතමයන්** සැපයීම සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම් සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සඳහන් කළ යුතුය. (එම පහසුකම් හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට/ කුලියට තිබිය හැක.) අමතර විස්තර ලංසු ලේඛනය සමග සපයනු ලැබේ.

5.6 අවසන් වසර තුනක් (3) තුළ වසර දෙකක (2) කාලයක් ආහාර සැපයීම පිළිබඳ අත්දැකීම් තිබිය යුතුය.

6. ලංසු ලේඛන නිකුත් කිරීම, ලංසු ඉදිරිපත් කිරීම සහ ලංසු විවෘත කිරීමට අදාළ දිනය සහ වේලාව පහත පරිදි වේ:

| | |
|---|---|
| ලංසු ලේඛන නිකුත් කිරීම ආරම්භ කිරීම | - **2023.06.21** |
| ලංසු ලේඛන නිකුත් කරනු ලබන අවසාන දිනය සහ වේලාව | - **2023.07.23 ප.ව.3.00 දක්වා** |
| ලංසු ඉදිරිපත් කළ යුතු අවසාන දිනය සහ වේලාව | - **2023.07.24 පෙ.ව.9.00 දක්වා** |
| ලංසු විවෘත කරන ස්ථානය, දිනය සහ වේලාව | - **යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගනය, යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ 2023.07.24 පෙ.ව.10.00 ට** |

7. **පූර්ව ලංසු රැස්වීමක්** 2023.07.06 දින පෙ.ව.10.00 ට පළමු මහල, නන්දිමිත්‍ර ශ්‍රවණාගාරය ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ හි දී පැවැත්වේ.

8. නැවත ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් පසු 16 ඡේදයේ ඇති ලිපිනයේ අධ්‍යක්ෂ, සැපයුම් සහ ප්‍රවාහන, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ලියවුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිලදී ගත හැකිය. ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව 2016.06.17 දිනැති අංක 06/ 2016 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය අනුව අය කෙරේ. (16 ඡේදයේ දක්වා ඇති සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ලිපිනයෙන් අදාළ ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු වටිනාකම් ලබාගත හැක.)

9. ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලංසුකරුවන් ලංසු ලේඛනයේ දී ඇති ආකෘති පත්‍ර පමණක් භාවිතා කළ යුතුය. මුද්‍රා තබන ලද ලංසු කවර ඉහත 6 ඡේදයෙන් දක්වා ඇති දිනය සහ වේලාවට පෙර, පිටපත් දෙකකින් යුතුව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු අතර, එසේ නැතහොත් **යුද්ධ හමුදා පුස්තකාලය, ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර), යුද්ධ හමුදා කඳවුර, පනාගොඩ, හෝමාගම** හි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

10. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් හට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

11. ලංසු **2024.03.31** දක්වා වලංගු විය යුතුය.

12. ඉදිරිපත් කරන ලංසුව සමග **2024.04.30** දක්වා වලංගු වන පරිදි ලංසු සුරක්ෂණයක් **ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය** නමට ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද, ඉල්ලූ විටක කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කළ හැකි ලංසු සුරක්ෂණයෙහි මුල් පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය. (අදාළ බැංකුවේ ලිපි ශීර්ෂය සහිතව) ලංසු සුරක්ෂණයෙහි වටිනාකම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 ප්‍රකාරව ලංසු ලේඛනයෙහි සඳහන් කර ඇත.

13. සියලුම ලංසුකරුවන් විසින් ලංසු ලේඛනයේ අවශ්‍ය යැයි දක්වා ඇති පරිදි නිෂ්පාදන සහතිකයන් ඉදිරිපත් කළ යුතු වේ.

14. ලංසුකරු විසින් ලංසු ලේඛනයේ අමතර තොරතුරු ඉල්ලා ඇති විශේෂිත අයිතම සඳහා නියැදීන් ඉදිරිපත් කළ යුතුය. නියමිත කාලසීමාව තුළ **නියැදියන් ලබා දීමට අපොහොසත් වන ලංසුකරුවන්ගේ ලංසු** වැඩිදුර ඇගයීම සඳහා සළකා නොලැබෙන අතර, එම ලංසුව **ප්‍රතිචාර නොදැක්වූ ලංසුවක් වශයෙන් සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

15. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය අතිරේක විස්තර වෙතොත් **ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂ** මණ්ඩලය මගින් ලබාගත හැකි අතර, ඊට අදාළ ලංසු ලිපි ලේඛන පහත ඡේද අංක 16 යටතේ දක්වා ඇති ලිපිනයේ දී කිසිදු ගාස්තු ගෙවීමකින් තොරව **2023.06.21** වන දින සිට **2023.07.23** වන දින දක්වා සතියේ වැඩ කරන දිනයන් හි **පෙ.ව. 09.00** සිට **ප.ව. 03.00** දක්වා පරීක්ෂා කළ හැකිය.

16. ඉහත සඳහන් කළ ලිපිනය වන්නේ ;


| | | |
|---|---|---|
| **අවධානයට** | : | අධ්‍යක්ෂ, සැපයුම් හා ප්‍රවාහන |
| **ලිපිනය** | : | යුද්ධ හමුදාධිපති,<br>යුද්ධ හමුදා මූලස්ථානය,<br>ශ්‍රී ජයවර්ධනපුර,<br>කෝට්ටේ. |
| **දුරකථන අංක** | : | 011 2302569, 011-2302568 |
| **ෆැක්ස් අංකය** | : | 011-2302569 |
| **විද්‍යුත් ලිපිනය** | : | dtesandt@army.lk / dtesandt0@gmail.com |


**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,**
**(ත්‍රිවිධ හමුදාව වෙත නැවුම් හා වියළි ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනය - 2024 වසර),**
**ආරක්ෂක අමාත්‍යාංශය.**
2023.06.21